# දේශපාලන ප්‍රචාරණ වැඩසටහන්හි සාර්ථක අසාර්ථකභාවය සඳහා ජන විඥානය හේතුවන ආකාරය

2014 බස්නාහිර පළාත් සභා මැතිවරණයේ අපේක්ෂකයන් දෙදෙනෙකුගේ ප්‍රචාරණ වැඩසටහන්වලට විශේෂිතව

දිලනි ගමගේ [1]

යම් ජනතාවක් සතුව පවතින ඇවතුම් පැවතුම්, ආචාර ධර්ම ආදී වූ පුරුෂාර්ථයන් ජන විඥානය නම් වේ. මිනිසා යම් ක්‍රියාවකට පෙළැඹෙන්නේ ජන විඥානයට අනුවය. ඒ නිසාවෙන් දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික සාධක ප්‍රවර්ධනය කිරීමේදී හා ප්‍රචාරණය කිරීමේදී එකී ජන විඥානය හඳුනාගෙන තිබීම අතිශය වැදගත් වේ. පහත අධ්‍යනය තුළ දේශපාලන ප්‍රචාරණ ක්‍රියාවලියේදී ජන විඥානය හඳුනාගන්නා ආකාරය කෙසේවීද යන්න සොයාබැලීම සිදුකරන ලදි.

පර්යේෂණයෙහි ගැටලුව වන්නේ දේශපාලන ප්‍රචාරණයේහි සාරථක අසාර්ථකභාවය පිණිස ජන විඥානය හඳුනාගත යුතුද? යන්නයි. උපන්‍යාසය වන්නේ දේශපාලන ප්‍රචාරණයේදී ජන විඥානය හඳුනාගත් දේශපාලනඥයා සාර්ථකවන බවයි.

අධ්‍යනය සඳහා දත්ත රැස්කිරීමේදී 2014 බස්නාහිර පළාත් සභා මැතිවරණයට ජාතික හෙළ උරුමය පක්ෂය නියෝජනය කරමින් එක්සත් ජනතා නිදහස් සන්ධානනය යටතේ තරඟ වැදුණු උදය ගම්මන්පිල සහ මධු මාධව අරවින්ද යන දේශපාලනඥයන් දෙදෙනා තෝරා ගන්නා ලදි. එහිදී එකී මැතිවරණය සඳහා නාමයෝජනා කැඳවූ 2014 ජනවාරි 30 වනදා සිට මැතිවරණය පැවැත්වූ 2014 මාර්තු 29 දක්වා කාලයේ තෝරාගත් දේශපාලනඥයන් දෙදෙනා විසින් පවත්වාගෙන යන ෆේස්බුක් පිටු සමග සම්බන්ධව සිටින රසිකයන්/මිතුරන් විසින් දැක්වූ අදහස් පළකිරීම් (Comments), කැමැත්ත පළකිරීම් (Likes) සහ හුවමාරුකරගැනීම් (Share) යනාදිය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයන් යොදාගනිමින් විශ්ලේෂණයට ලක් කරන ලදි. එසේම තෝරාගත් දේශපාලනඥයන් දෙදෙනා සමග සම්මුඛ සාකච්ඡාවන් ද පැවැත්වීය. ඊට අමතරව දේශපාලන විද්වතුන් 05 දෙනෙකු සම්මුඛ සාකච්ඡාවට ලක් කරමින් අපේක්ෂකයන් දෙදෙනාගේ මැතිවරණ ව්‍යාපාර පිළිබඳ විචාරාත්මක අදහස් ලබාගැනීම සිදුකළහ.

අධ්‍යනයෙන් අනාවරණය කරගත් දත්ත විශ්ලේෂනයෙන් පැහැදිලිවූයේ මැතිවරණ ප්‍රචාරණ වැඩසටහන් සාර්ථක කරගැනීමට සමත් වූ දේශපාලනඥයන් එහිදී ජන විඥානය නිසි ලෙස ආමන්ත්‍රණය කරතිබීම අදාළ සාර්ථකත්වයට පැහැදිලිවම හේතු වූ බවයි. ආගමික, සංස්කෘතික සහ ආර්ථිකමය කරුණු පිළිබඳ ඡන්දදායක ආකල්ප නිවැරදිව හඳුනාගෙන කටයුතු කරන්නට දේශපාලනඥයෙකු සමත් නොවුනහොත් එය ඒ දේශපාලනඥයාගේ මැතිවරණ ප්‍රචාරණ වැඩසටහනෙහි අසාර්ථකභාවයට හේතුවන බව අධ්‍යනය තුළින් අවසානයේ පැහැදිලි විය.

මේ අනුව ජන විඥානයට වඩාත් සවිඥානිකවූ මැතිවරණ ප්‍රචාරණ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම මැතිවරණ ව්‍යාපාරයක ජයග්‍රහණයට අත්‍යවශ්‍යම සාධකයක් වේ.

මූල පද - ජන විඥානය, දේශපාලන ප්‍රචාරණය

---

[1] සහකාර කථිකාචාර්ය , ජනසන්නිවේදන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය,